සැබෑ අරුත් සමාජයෙන් සමාජයට, සංස්කෘතියෙන් සංස්කෘතියට වෙනස් වුවත්, සමාජය තුළ ජීවත් වන්නන්ගේ යහපත් දිවි පැවැත්ම උදෙසා අත්‍යවශ්‍ය වන්නේය. මානව හිමිකම් ගැන මහ ඉහළින් කතා කරන්නවුන් පවා, අන් අය ඇගයීම, අනුන්ට ගරු කිරීම, නිහතමානී කම වැනි යහගුණ අමතක කර ලමින් සිටීම ඛේදනීය තත්වයකි.

සම්ප්‍රදාය යනු වෙනස් වන සමාජය තුළ යම් තරමකට වෙනසට, සංශෝධනයට භාජන විය යුත්තක් බව පිළිගත යුතුව ඇත. "පියාගේ ළිඳ යයි කියමින් කිවුල් ජලය පානය කළ යුතු නැත" යන්න සමාජයේ ප්‍රකට යෙදුමකි. ඒ අනුව සම්ප්‍රදාය යන්න ගෙන බැලුවද, හුදෙක් පැරණි සමාජය පිළිගත් දේ නිසාම ඒවාට සම්පූර්ණයෙන්ම අනුගත විය යුතු නැත. එහෙත් අප මෙතෙක් දුර ඉදිරියට ගෙන ආ සම්ප්‍රදායයන් තුළ මිනිස් සමාජයට එදත් අදත් මතුවටත් හිතකර අංග කොතෙකුත් ඇත. එවැනි දේ අනුගමනය කිරීම, ඉහත දැක්වූ 'කිවුල් ජලය පානය කිරීමක්' නොවන්නේය. පෙරදිග සමාජයන්හි අද සිදු වෙමින් පවත්නා වෙනස්කම් සමගම සම්ප්‍රදායයන් ද තව දුරටත් ජනයා අතර රැඳී පවතින්නේ ඒවායේ අගය හා වටිනාකම නිසයි. දැනුමෙන්, නුවණින් හා පළපුරුද්දෙන් වැඩි පුද්ගලයා සමාජය තුළ ඇගයීමට ලක් වීම එම සම්ප්‍රදායට අනුකූල වෙයි. නයිජීරියාවේ වෙසෙන 'ඉබෝ' ගෝත්‍රික සමාජයෙහි පුද්ගලයකුගේ ගරුත්වය මනිනු ලබන්නේ එම පුද්ගලයා වහරන බසෙහි අන්තර්ගත ප්‍රස්තාව පිරුළු ආදියෙහි සංඛ්‍යාව අනුවයි. එමගින් හැඟෙනුයේ කෙනකුගේ දැනුම පාදක කරගනිමින් ඔහු හෝ ඇය සෙස්සන්ගේ ගෞරවය ලැබිය යුතු බවයි. මෙයින් ද හැඟී යන පරිදි සාම්ප්‍රදායික ඥානය තව දුරටත් සමාජයන්හි ඇගයීමට ලක් වන අතර ඒ අනුව පුද්ගලයාගේ ගරුත්වය ද මැන බැලෙන බවයි. අනික් අතට සමාජය වෙතින් එබඳු ගරුත්වයක් ලබන තැනැත්තාගේ නිහතමානී බව ද පොදුවේ සමාජයන්හි තව දුරටත් ඇගයීමට ලක් වෙයි.

සොබාදහමෙන් අපට උගන්වන පාඩම ද උක්ත අදහස් තව දුරටත් සනාථ කරයි. පැසී නැමෙන රන්-වන් වී කරල් තව තවත් බිමට පාත් වෙමින් එහි බරසාර බව මෙන්ම අගය හා වටිනාකම ද ස්වභාව ධර්මයේ අපූරු පාඩමක් ලෙසින් අපට කියා දෙයි. එවන් ගෞරවනීය පුද්ගලයන් කිසි විටෙකත් සුළු දෙයින් සැලෙන හෝ කම්පා වන අය නොවන බව අමුතුවෙන් කිව යුතු නොවේ. තථාගත බුදු රජාණන් වහන්සේ මුළු ලෝකවාසීන්ගේම යහපත පතා දෙසූ ධර්ම ස්කන්ධය අපරිමිතය. උන්වහන්සේ වැඩ විසූ කාල සීමාව තුළදී ද උන්වහන්සේට එරෙහිව නැගී සිටිමින්, පරිභව කරන්නට යෙදුණ අය ද වූහ. එබඳු අවස්ථාවලදී උන්වහන්සේ එයින් සැලෙනු වෙනුවට සිය ගැඹුරු අධ්‍යාත්මය ප්‍රකට කරමින් නොසැලී සිටියේ පැසී බිමට නැමෙන රන්වන් වී කරලක ගරු ගාම්භීර බව මෙන්ම නිහතමානී පෙනුම ද කියා පාමිනි.

සිංහල ජන සමාජය එදා මෙන්ම අදත් පුළුල් දැනුමැති, නිහතමානී, වටිනා පුද්ගලයන් අගය කිරීමට පසුබට නොවෙයි. මෙම සමාජයෙහි ප්‍රචලිත තවත් ආප්තෝපදේශ ඇසුරෙන් ද මේ බව සනාථ කළ හැකිය. ඉංග්‍රීසි බසින් ද වහරනු ලබන ආප්තෝපදේශවලට සමානව යමින්, "පිරුණු කළේ දිය නොසැලේ", "අඩු කළේ ගැස්සෙයි" වැනි පිරුළු සිංහල ජනවහරට එක් වී ඇත්තේ ද මෙම නිහතමානී බව ගැනම තව තවත් කරුණු සනාථ කරමිනි. දියෙන් පිරී ඇති කළයක් හෝ බඳුනක් සොලවන විට එයින් නැගෙන හඬක් ඇතොත් එය ඉතාම අල්ප වශයෙනි. ජල මට්ටම ඉහළ තලයටම නොමැති වතුර බඳුනක් සෙලවීමේදී එහි චලනය මෙන්ම ශබ්දය ද වැඩි වේගයකින් හා හඬකින් අසන්නට, දකින්නට ලැබේ. එමෙන්ම සමාජයක් තුළ ජීවත් වන උගත්, බුද්ධිමත්, පළපුරුදු සහිත, කාරුණික හා ගුණවත් පුද්ගලයෙක් තමනට අසාධාරණයක් සිදු වන විටදී හෝ නිරපරාදේ තමන්ට චෝදනා නැගෙන විටදී හෝ එයින් කලබලයට පත් නොවී සන්සුන්ව හිඳිමින් එම තත්වයට මුහුණ දෙයි. මෙලෙසින් බලන විට ආධ්‍යාත්මික වශයෙන් ගත් කල, දැනුමෙන් හා බුද්ධියෙන් ඉහළ තලයක පසු වන පුද්ගලයා අටලෝ දහමෙන් නොසැලී ස්ථාවරව හිඳීමට උත්සාහ දරනු ඇත. එවන් නිහතමානී පුද්ගලයෙක් තම දැනුම, කුසලතාව, ධනවත් බව, බලය ආදී කිසිවක් හුවා දක්වන්නට හඬ නොනගනු ඇත. එය හරියටම ජලය පිරුණු කළයක් සෙලවීමේදී ඒ තුළ ඇති ජලය වැඩි චංචල බවකට පත් නොවන්නාක් මෙනි.

ඉහතින් දැක්වූ පරිදි අන්තර් ජාලයෙහි සටහන් වී තිබූ සරල සැකෙවි කව මගින් එහි නිර්මාණ කරුවා තම තරුණ වියේදීම සමාජය දෙස මධ්‍යස්ථව බලන්නටත් ඉවසීමෙන් යුතුව කටයුතු කරන්නටත් යොමු වී සිටින්නකු බව විශද කරවයි. උගත්, බුද්ධිමත් මෙන්ම සමාජයේ ආදරයට හා ගෞරවයට පාත්‍ර වී සිටින ගුරුතුමියකගෙන්, කිසිදු පන්ති කාමරයකදී තමන් කිසිදු විෂයයක් හදාරා නැතත් එම චරිතයෙහි දක්නට ලැබෙන නිහතමානී ගුණය තමන්ගේ ජීවිතයට ද ආලෝකයක් වන්නට හැකි වන පරිදි ලබා දී ඇති බව ඔහු සතුටින් පවසන අවස්ථාවක් උක්ත නිර්මාණයෙහි ගැබ් වී ඇත. එමතු නොව මෙම නිර්මාණ කරුවාගේ කවිත්වය හා සංවේදී බව සමගම සමාජය පිළිබඳ පුළුල් නිරීක්ෂණයක යෙදීමේ හැකියාව ද මෙම කෙටි නිර්මාණයෙන් පෙන්වා දෙයි.

සොබාදහම මිනිස් ජීවිතයට බෙහෙවින් සමීප කරගත් ජනතාවක් ලෙස ශ්‍රී ලාංකික සමාජය හඳුන්වා දිය හැකිය. ලෝකයේ වෙනත් ඇතැම් රටවල් දෙස බලන විට විශේෂයෙන්ම ජපානය, එහි වෙසෙන ජනතාව සොබාදහම යනු තම ජීවිතවල අංගයක් ලෙස සලකති. තමන් ද සො-බාදහමේ කොටසක් ලෙස සිතන්නට පුරුදුව සිටින ඔවුහු ද, බත් ප්‍රධාන ආහාරය කොටගත් පිරිසක් වන හෙයින් වී වගාවට නැඹුරු වටපි-ටාවක ජීවත් වීම දක්නට ඇත. වර්තමානයේ දියුණු වෙමින් පවතින නාගරික පරිසරයෙහි එවන් දේශීය මුහුණුවරක් බාහිර වශයෙන් නොපෙනුණද 'බත' ඔවුන්ගේ දිවි රැකගැනීමට උපකාරී වන ප්‍රධාන ආහාරයයි. බත සපයන කෘෂිකාර්මික පරිසරයෙහි 'පැසී නැමුණු' රන්වන් වී කරල්වල දර්ශනය ඔවුනට ද මනහර දසුනක් වන බවට සැකයක් නැත.

ශ්‍රී ලාංකික ජනතාවට පැසී, නැමී, බිමට බර වී ඇති වී කරල සුන්දර දර්ශනයකි. ඒ අතරතුර, උක්ත නිර්මාණ කරුවා එහි දකින සැබෑ සුන්දරත්වයෙන් ඔබ්බට යමින් එයින් පිළිබිඹු කෙරෙන අගනා ගුණාංගය මතු කර ලීමට ද මෙම සැකෙවි කව ප්‍රයෝජනයට ගෙන ඇත. ඔහුගේ නිර්මාණයට අනුව, පැසුණු රන්වන් කරල බිමට බර වී ඇත්තේ 'ස්නේහයෙනි'. මෙමගින් නවතම කවි සංකල්පනාවක් මතු කර ලන්නට ද මෙම නිර්මාණ කරුවා යොමු වී ඇත. වී කරල දයාවෙන්, සෙනෙහසින් යුතුව බිමට බර වී, නැමී සිටින්නේ ද අහස උසට සිටිමින් තමන් පමණක් රජ කරන්නට නොව තම බාලයන් ද යහමගට යොමු කරවන්නට කැමැත්තෙන්ම යොමු වන වැඩිහිටි කාන්තා චරිතයක ස්වභාවය පළ කරමිනි. ස්නේහයෙන් බිමට බර වී තිබෙන වී කරල සමාජයට යහගුණ පිළිබඳ ප්‍රබල පාඩමක් කියා දෙයි. දැනුම වැඩි වන්නට වැඩි වන්නට පුද්ගලයෙක් නිහතමානී බවෙන් යුතුව සමාජ මෙහෙවරක් කරන්නේ නම්, පැසී නැමුණු රන්වන් වී කරල මෙන් සෙසු සමාජයට ද, විශේෂයෙන්ම ඉදිරි පරපුරට 'විසල් පාඩමක්' කියා දෙනු නියතය. මෙම නිර්මාණ කරුවා ඉතා කෙටි කවකින් සහෘදයනට කියා දෙන්නේ ද කෙනකුගේ නිහතමානී ගුණය ගැන පමණක් නොව නිර්මාණ කරණය පිළිබඳවත්, රසඥතාව පිළිබඳවත්, 'විසල් පාඩමකි'.

**සොබාදහම මිනිස් ජීවිතයට බෙහෙවින් සමීප කරගත් ජනතාවක් ලෙස ශ්‍රී ලාංකික සමාජය හඳුන්වා දිය හැකිය. ලෝකයේ වෙනත් ඇතැම් රටවල් දෙස බලන විට විශේෂයෙන්ම ජපානය, එහි වෙසෙන ජනතාව සොබාදහම යනු තම ජීවිතවල අංගයක් ලෙස සලකති.**

